# 2025-06-23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් සුරක්ෂිත ජල පරිභෝජනය තහවුරු කිරීම සඳහා රට තුළ ඇති සියලු ජල මූලාශ්‍ර සංරක්ෂණය, එල්ලංගා පද්ධතිය සක්‍රීය කිරීම, ගංගා ද්‍රෝණි නිසි පරිදි අධ්‍යයනය කර පෝෂණය කිරීම මෙන්ම, විවිධ භාවිතයන් සඳහා ජල පරිභෝජනය නියාමනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරනු ලැබ ඇත. එබැවින්, රටේ සියලුම ජල මූලාශ්‍ර පෝෂණය කර ආරක්ෂා කරමින් වර්තමාන හා අනාගත පරපුරට ජල සම්පත සුරක්ෂිතව පරිහරණය කිරීමට අවකාශය සලසන රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. දැනට බලාත්මක ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය තවදුරටත් සංශෝධනය විය යුතු බව විවිධ පාර්ශ්ව විසින් ද පෙන්වා දී ඇත. ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාවක් සැලකිල්ලට ගනිමින්, දැනට බලාත්මක ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය නැවත සමාලෝචනය කර වත්මන් රජයේ ප්‍රතිපත්තිය හා අනුගත වන අයුරින් එකී ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස, පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කරන ලදී:

* ගරු කේ.ඩී. ලාල් කාන්ත මැතිතුමා
  කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය

* ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා
  කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය

* ගරු අනුර කරුණාතිලක මැතිතුමා
  නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය

* ගරු (ඉංජිනේරු) කුමාර ජයකොඩි මැතිතුමා
  බලශක්ති අමාත්‍ය

* ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මැතිතුමා
  පරිසර අමාත්‍ය



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

02. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන ජංගම රාජ්‍ය සේවා වැඩසටහන

ග්‍රාමීය ප්‍රදේශවල හා අඩු පහසුකම් සහිත නාගරික ප්‍රදේශවල පදිංචි ජනතාවට ඉඩම් භාවිතය, ගොඩනැගිලි සඳහා අනුමැතීන් ලබා ගැනීම, නිවාස පහසුකම් නොමැති වීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ ජල සැපයුම් සේවා සම්බන්ධයෙන් මතුවන ගැටලු නිරාකරණය කර ගැනීමේදී දැඩි අසීරුතාවලට මුහුණ පෑමට සිදුවන බව හඳුනාගනු ලැබ ඇත. එම සේවාවන් ජනතාවට වඩාත් පහසුවෙන් ලබා ගැනීමට හැකි වන පරිදි ජංගම රාජ්‍ය සේවා වැඩසටහනක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය සැලසුම් කර තිබේ. යෝජිත වැඩසටහන මඟින් එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය යන ආයතනවල විෂය පථයන්ට අදාළ සේවාවන් සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු සඳහා මහජනතාවට සෘජුවම එකී ආයතනවල නිලධාරීන් සමඟ සම්බන්ධ වී විසඳුම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, යෝජිත ජංගම රාජ්‍ය සේවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. වීදිවල සිඟමනේ යෙදවීම, භාණ්ඩ අලෙවියේ යෙදවීම සහ ගෘහස්ථ සේවය ඇතුළු අන්තරායකාරී රැකියාවල ළමුන් යෙදවීමට අදාළ නීතිමය විධිවිධාන දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව වයස අවුරුදු 18ට අඩු පුද්ගලයෙකු, ළමයෙකු වශයෙන් නිර්වචනය කරනු ලැබ ඇත. නවතම සංඛ්‍යාලේඛනවලට අනුව, රටේ මුළු ජනගහණයෙන් 30%ක් පමණ ළමා ජනගහණයට අයත් වේ. ඇතැම් ළමුන් විවිධ හේතූන් මත කුමන හෝ රැකියාවක් කිරීමට පෙළඹී ඇති බව, තමාගේ මව හෝ පියා සමඟ, එසේ නොමැති නම් මිනිස් වෙළෙඳාමේ ගොදුරක් ලෙස "වීදි දරුවෙකු" බවට පත් වී දෙමාපියන් නොවන අයෙකු සමඟ පොදු ස්ථාන ආශ්‍රිතව සිඟමනේ යෙදෙන බව සහ නොයෙක් දේ අලෙවි කරන බව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, වයස අවුරුදු 16ට අඩු ළමයින් සිඟමනේ යෙදවීම, වෙළෙඳාම් කටයුතුවල යෙදවීම සහ වයස අවුරුදු 16 - 18 අතර ළමුන් ගෘහ සේවය ඇතුළු අනතුරුදායක රැකියාවල යෙදවීම 2025-07-01 දින සිට සපුරා තහනම් කිරීමට හැකි වන පරිදි දැනට පවතින නීතිමය විධිවිධාන අදාළ බලධාරීන් මඟින් දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමටත්, ඒ පිළිබඳව පුළුල්

ප්‍රචාරණ වැඩපිළිවෙලක් මඟින් මහජනතාව දැනුම්වත් කිරීමටත් සිය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩපිළිවෙල කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

**04. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයට ලක් කිරීමට අදාළ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයට ලක් කිරීමට අදාළව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 20ක අරමුදල් සලසා දීමට මහජන චීන සමූහාණ්ඩුව එකඟතාව පළ කර තිබේ. ගරු ජනාධිපතිතුමා විසින් මෙම වසරේ ජනවාරි මාසයේ චීනයේ සිදු කරන ලද නිල සංචාරය අතරතුරදී එම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශ්වය අතර එකඟතාවකට එළඹ ඇත. ඒ අනුව, එම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් පාසල් 500ක් සහ ආදර්ශ ස්මාර්ට් පන්ති කාමරයක් සඳහා අවශ්‍ය වන උපාංග යෝජිත ව්‍යාපෘතිය මඟින් ලබා දීමටත්, එම ව්‍යාපෘතිය යටතේ වන ජාල මෙහෙයුම් කළමනාකරණ ඒකකය, වැඩසටහන් මෙහෙයුම් මැදිරිය සහ සම්මන්ත්‍රණ කාමරය 'ඉසුරුපාය' පරිශ්‍රය තුළ ස්ථාපිත කිරීමටත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. කොළඹ තර්ස්ටන් විද්‍යාලය සඳහා නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ පවතින පැරණි තෙමහල් ගොඩනැගිල්ලක් සිසුන්ගේ භාවිතයට නුසුදුසු බවත්, එය කඩා ඉවත් කළයුතු බවත් මොරටුව විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි විශේෂඥයින් විසින් ලබා දී ඇති වාර්තාවක් මඟින් පෙන්වා දී ඇත. ඒ අනුව, එම ගොඩනැගිල්ල වෙනුවට නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. මින්නේරිය, ගිරිතලේ, ගල්ඔය, හුරුළුවැව සහ රාජාංගනය වාරි යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය**

පසුගිය කාලයේ අවස්ථා කිහිපයකදී ඇති වූ ගංවතුර හේතුවෙන් වියළි කලාපයේ ප්‍රධාන වාරි යෝජනා ක්‍රම කිහිපයකට දැඩි හානි සිදු වීම හේතුවෙන්, එම යෝජනා ක්‍රමවල වගා ඉඩම් සඳහා ජලය නිකුත් කිරීමට දැඩි බාධාවන් පැන නැඟී ඇත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අම්පාර දිස්ත්‍රික්කයේ ගල්ඔය යෝජනා ක්‍රමය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය හා ගිරිතලේ වාරි ව්‍යාපාර සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළුවැව හා රාජාංගනය යන වාරි යෝජනා ක්‍රමවල ඇළ පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2025 අයවැය යෝජනා මඟින් රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන වෙන් කර තිබේ. එකී ප්‍රතිපාදන භාවිත කරමින් ඉහත සඳහන් වාරි ව්‍යාපාරවල පහත සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* මින්නේරිය වාරි ව්‍යාපාරයේ වාරි පද්ධතිය හා ජලාපවහන ඇළ මාර්ග පිළිසකර කිරීම - රුපියල් මිලියන 300
* ගිරිතලේ වාරි ව්‍යාපාරයේ වාරි පද්ධතිය පිළිසකර කිරීම - රුපියල් මිලියන 200
* ගල්ඔය යෝජනා ක්‍රමයේ ගංවතුර හානි හා කැඩී ගිය ඇළ පද්ධති පිළිසකර කිරීම - රුපියල් මිලියන 900
* හුරුළුවැව වාරි ව්‍යාපාරයේ වාරි පද්ධතිය හා ජලාපවහන ඇළ මාර්ග පිළිසකර කිරීම - රුපියල් මිලියන 300
* රාජාංගනය වාරි ව්‍යාපාරයේ ගුරුත්ව හා උස්සාන වාරි පද්ධතීන්හි පිළිසකර කිරීම සිදු කිරීම - රුපියල් මිලියන 300

**07. අපනයන කෘෂි බෝග නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගම්මිරිස්, කෝපි, පුවක්, කොකෝවා, කරාබු, සාදික්කා, කරදමුංගු, වැනිලා, බුලත්, සේර, පැඟිරි, ගොරකා, කහ සහ ඉඟුරු යන අපනයන කෘෂි බෝග 14ක් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සංවර්ධන සහ පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි. වර්තමානය වන විට හෙක්ටයාර 82,000ක පමණ වපසරියක මෙම බෝග ව්‍යාප්තව පවතින අතර, මිලියනයකට ආසන්න පාර්ශ්වකරුවන් පිරිසක් අපනයන කෘෂි බෝග ආශ්‍රිත වගාවන් හා කර්මාන්තයන්හි නියැළී සිටිති. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂයේ සිට පාර්ශ්වකරුවන් දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, එම වැඩසටහන් යටතේ වගාකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් සිදු කරනු ලබන ආයෝජන මුදලින් 50%ක උපරිමයක් දක්වා

රජයේ ප්‍රතිලාභ ලබා දීමටත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* අපනයන කෘෂි භෝග නව වගා ව්‍යාප්තිය වැඩිකිරීමේ වැඩසටහන
* අපනයන කෘෂි භෝග වගාවන්හි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන
* කාබනික අපනයන කෘෂි භෝග වගා ප්‍රවර්ධන වැඩසටහන
* කාබනික වගා සහතිකකරණය සහ රසායනාගාර විශ්ලේෂණයට අදාළ කටයුතු
* ජාත්‍යන්තර සාධාරණ වෙළෙඳ ක්‍රමය (Fair Trade) සහතිකය ලබා දීම
* අන්තර්ජාතිකව පිළිගත් කාබනික වගාවට අදාළ කර ගත හැකි අනෙකුත් සහතික ලබා දීම
* පසු අස්වනු තාක්ෂණ වැඩසටහන සඳහා පහසුකම් සැපයීම
* පැළ තවාන් සංවර්ධන වැඩසටහන
* අපනයන කෘෂි භෝග වගා ආදර්ශන නඩත්තු කිරීම
* සංචාරක කර්මාන්තය හා බැඳුණු අපනයන කෘෂි භෝග ව්‍යාපෘති

**08. අධිවේගී මාර්ග මෙහෙයුම් සඳහා නව අධි සුඛෝපභෝගී බස් රථ 200ක් ප්‍රසම්පාදනය කිරීම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සාමාන්‍ය බස් රථ ඇණියෙන් 52%කට ආසන්න ප්‍රමාණයක් සහ සුඛෝපභෝගී බස් රථ ඇණියෙන් 94%කට ආසන්න ප්‍රමාණයක් ආර්ථික ආයු කාලය ඉක්මවා ගොස් ඇති බැවින්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රීලංගම) බස් රථ ඇණියට නව බස් රථ හඳුන්වා දීමේ හදිසි අවශ්‍යතාවක් පවතී. අධිවේගී මාර්ගවල මගී ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් බස් රථ නොමැතිකම හමුවේ ශ්‍රී ලංගම විසින් දැනට පෞද්ගලික අංශයට අයත් සුඛෝපභෝගී බස් රථ 61ක් ලාභ බෙදා ගැනීමේ පදනම මත ධාවනයේ යොදවනු ලබයි. අධිවේගී මාර්ග සඳහා අධි සුඛෝපභෝගී බස් රථ 200ක් තම අරමුදල් යොදා ගනිමින් මිල දී ගැනීමට ශ්‍රී ලංගමය විසින් තීරණය කර ඇත. ඒ අනුව, මූල්‍ය හැකියාව ඇති ඩිපෝ මගින් අධි සුඛෝපභෝගී බස් රථ 29ක් සෘජුවම මිල දී ගැනීමටත්, ශ්‍රී ලංගමයේ අරමුදල් භාවිත කරමින් මූලික ගෙවීම සිදු කර, ඉතිරි මුදල වසර 05ක් තුළ මාසික වාරික වශයෙන්

උපයන ආදායමෙන් ගෙවීම හරහා සෙසු බස් රථ ප්‍රමාණය මිල දී ගැනීමටත් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. කොළඹ වරායේ ජය බහළු පර්යන්ත – V අංගනයට ගල් අතුරා තාර දැමීම සඳහා වන ප්‍රසම්පාදනය**

මධ්‍යම ප්‍රමාණයේ බහළු නෞකා දෙකකට පහසුකම් සැපයීමට හැකි වන පරිදි දැනට පවත්නා ජය බහළු පර්යන්ත - IVහි ජැටි බැම්ම දීර්ඝ කිරීමට සහ අංගන ධාරිතාව වැඩි කිරීම සඳහා පසුපස අංගන ප්‍රදේශය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සැලසුම් කර තිබේ. ජය බහළු පර්යන්තය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ජය බහළු පර්යන්ත - Vහි ඉතිරි සංවර්ධන කටයුතු අවසන් කළ යුතුව ඇත. ඒ අනුව, පස් පුරවා සංවර්ධනය කරන ලද අංගන ප්‍රදේශයේ ගල් අතුරා තාර දැමීම හා පවත්නා අංගනයට සම්බන්ධ කිරීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු 09ක් ලැබී ඇත. ඒ අනුව, ලංසු ඇගයීම් කමිටුවේ සහ ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, අදාළ ප්‍රසම්පාදනය M/s Maga Engineering (Pvt)Ltd වෙත ප්‍රදානය කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. එච්අයිවී/ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාවට එරෙහිව සටන් කිරීම සඳහා වූ ගෝලීය අරමුදල මඟින් සලසනු ලබන ප්‍රදාන අරමුදල් යටතේ එච්අයිවී/ඒඩ්ස් රෝගය සහ ක්ෂය රෝගය කළමනාකරණය, වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

එච්අයිවී/ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව යන රෝග ත්‍රිත්වය කළමනාකරණය, වැළැක්වීම සහ පාලනය කිරීමට සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ 2002 සිට එච්අයිවී/ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාවට එරෙහිව සටන් කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (GFATM) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබ ඇත. 2021 වර්ෂයේ සිට එම ව්‍යාපෘතිය යටතේ ක්ෂය රෝගය සහ එච්අයිවී/ඒඩ්ස් යන සංරචක දෙක පමණක් ක්‍රියාත්මක කර තිබේ. ක්ෂය රෝගය පාලනය කිරීම සඳහා වන ජාතික උපායමාර්ගික සැලැස්මේ සහ ශ්‍රී ලංකාවේ එච්අයිවී/ඒඩ්ස් වසංගතය අවසන් කිරීම සඳහා වන 2023-2027 ජාතික උපායමාර්ග සැලැස්මේ නියමිත ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2025-2027 ආධාර ප්‍රදාන චක්‍රය ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බවට හඳුනාගෙන ඇත. 2025-2027 කාලය තුළ ක්ෂය රෝග සංරචකය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 2.97ක අරමුදල් සහ එච්අයිවී/ඒඩ්ස් පාලන

වැඩසටහන සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 6.38ක අරමුදල් ලබා දීමට එච්අයිවී/ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාවට එරෙහිව සටන් කිරීම සඳහා වූ ගෝලීය අරමුදල විසින් එකඟතාව පළ කර ඇත. ඒ අනුව, එකී ප්‍රදාන අරමුදල් භාවිත කරමින් එකී ව්‍යාපෘති දෙක වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **නුවරඑළිය තැපැල් කාර්යාල ගොඩනැගිල්ල සඳහා වන යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය**

නුවරඑළිය තැපැල් කාර්යාල ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමට 2024-04-29 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී තිබේ. එම පවරා දීමට විරුද්ධව තැපැල් සේවකයින් මෙන්ම සිවිල් සංවිධාන හා පොදු මහජනතාව අතරින් විරෝධතා එල්ල විය. එම ගොඩනැගිල්ල තැපැල් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා පෙර පරිදිම යොදා ගැනීමට සහ සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිත කිරීමට හැකි වන පරිදි සකස් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පසුව තීරණය කර තිබේ. ඒ අනුව, නුවරඑළිය තැපැල් කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අහෝසි කිරීමටත්, දේශීය/විදේශීය සංචාරක ආකර්ෂණය වර්ධනය කර ගැනීම සහ නව ආදායම් උත්පාදන මාර්ග වැඩිදියුණු කර ගැනීමට හැකි වන පරිදි එකී ගොඩනැගිල්ල සහ ඉඩම නවීකරණය කිරීමටත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **නාවලපිටිය, දඹුල්ල සහ කුලියාපිටිය යන දිස්ත්‍රික් රෝහල් සඳහා CT ස්කෑන් යන්ත්‍ර 03ක් ප්‍රසම්පාදනය කිරීම**

නාවලපිටිය, දඹුල්ල සහ කුලියාපිටිය යන දිස්ත්‍රික් රෝහල් සඳහා CT ස්කෑන් යන්ත්‍ර 03ක් (64 Slices) සැපයීම, බෙදා හැරීම, ස්ථාපනය, ක්‍රියාත්මක කරවීම හා නඩත්තු කිරීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු 04ක් ලැබී ඇත. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සහ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ නිර්දේශ මත පදනම්ව නාවලපිටිය, දඹුල්ල සහ කුලියාපිටිය දිස්ත්‍රික් රෝහල් සඳහා CT ස්කෑන් යන්ත්‍ර 03ක් (64 Slices) සපයා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය M/s Hayleys Lifesciences (Pvt). Ltd වෙත පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. පෙර පුරවා ඇති එනොක්සපාරින් සෝඩියම් එන්නත් 6,000අයියු, මි.ලි. 0.6 සිරින්ජර් 500,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

හෘද රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා භාවිත කරන පෙර පුරවා ඇති එනොක්සපාරින් සෝඩියම් එන්නත් 6,000අයියු, මි.ලි. 0.6 සිරින්ජර් 500,000ක් සපයා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 4ක් ලැබී තිබේ. තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ඉන්දියාවේ Emcure Pharmaceuticals Ltd වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. රාජ්‍ය ප්‍රසම්පාදනය සඳහා වන නීතිය කෙටුම්පත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය ඇතිව රාජ්‍ය ප්‍රසම්පාදනය සඳහා වන නීතිය කෙටුම්පත් කිරීම සඳහා ජාත්‍යන්තර උපදේශකයෙකුගේ සහ දේශීය උපදේශකවරුන් දෙදෙනෙකුගේ සේවය ලබා ගෙන ඇත. ඔවුන් විසින් පිළියෙල කරන ලද මූලික කෙටුම්පත ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් විදේශීය නියෝජිතායතන, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියලු පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනා ලබාගෙන තවදුරටත් වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව, එකී කෙටුම්පත මත පදනම්ව රාජ්‍ය ප්‍රසම්පාදනය සඳහා වන නීතිය කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම (මහ මුහුදේ අන්තරායකර ඖෂධ ජාවාරම් තහනම් කිරීම)

විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත (මහ මුහුදේ අන්තරායකර ඖෂධ ජාවාරම තහනම් කිරීම) සංශෝධනය කිරීම පිණිස ඉදිරිපත් කරන ලද යෝජනාව 2025-02-09 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගෙන ඇත. එහිදී අදාළ සියලු පාර්ශ්වයන්ගේ අදහස් ලබා ගෙන, මූලික කෙටුම්පතක්/ සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දී ඇත. ඒ අනුව, අදාළ

පාර්ශ්වයන්ගේ අදහස් ලබා ගෙන, විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සඳහා වන සංශෝධන හඳුනා ගනු ලැබ තිබේ. එකී සංශෝධන මත පදනම්ව විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පත් සකස් කිරීමට පියවර ගන්නා ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය

සූරාකෑම සඳහා වන ළමා වෙළෙඳාම බරපතල මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් මෙන්ම ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධයක් වශයෙන් සලකනු ලබයි. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සහ අනෙකුත් ජාත්‍යන්තර ප්‍රතිපත්ති රාමු යටතේ වන බැඳීම හා අනුගත වෙමින් ශ්‍රී ලංකාව සිය ජාතික ප්‍රතිචාරය නෛතික ආයතන සහ කාර්ය පටිපාටිමය යාන්ත්‍රණයක් තුළින් සවිමත් කිරීමට කැප වී සිටියි. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින් කාන්තා හා ළමා කාර්යාංශය, ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ විවිධ ඒකක, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, නීතිපති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් හා එක්ව "ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය" යනුවෙන් පුළුල් සම්මත මෙහෙයුම් පටිපාටියක් සකස් කර ඇත. එකී සම්මත මෙහෙයුම් පටිපාටිය සඳහා නීතිපතිගේ නිෂ්කාශණය ලැබී තිබේ. ඒ අනුව, ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය අදාළ පාර්ශ්වකරුවන් විසින් විධිමත් ව ක්‍රියාවට නැංවීමට හැකිවන සේ එකී සම්මත මෙහෙයුම් පටිපාටිය රජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ඉහළ නැංවීම සඳහා එහි පරිපාලන ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කිරීම**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත වෙනුවට නව පනතක් හඳුන්වා දීම සඳහා 2025-01-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලබා දී ඇත. ඒ අනුව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතුව පත් කරනු ලැබ ඇති විද්වත් කමිටුවක් විසින් සකස් කරනු ලැබ ඇති සංකල්ප පත්‍රිකාව මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **මැදපෙරදිග කලාපයේ උද්ගතව ඇති වාතාවරණය**

මැදපෙරදිග කලාපයේ මේ වන විට උද්ගතව ඇති උණුසුම් යුද්මය වාතාවරණය හේතුවෙන් ඉදිරියේදී ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු විය හැකි අභියෝග සම්බන්ධයෙන් පූර්ව සූදානමක් පැවතීමේ අවශ්‍යතාව පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් සිය අවධානය යොමු කරන ලදී. ඒ අනුව, මැදපෙරදිග යුද්මය තත්ත්වය පිළිබඳව සමීපව අධ්‍යයනය කරමින්, බලපෑමට ලක් විය හැකි සියලු ක්ෂේත්‍ර, බලපෑමේ ප්‍රමාණයන් සහ ඒ සම්බන්ධයෙන් ගත යුතු කඩිනම් ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචනයන් සිදු කර, අමාත්‍ය මණ්ඩලය වෙත අවස්ථානුකූලව යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පහත සංයුතියෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කිරීමටත්, එම අනුකමිටුවට සහාය වීම පිණිස අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

* ගරු විජිත හේරත් මැතිතුමා
  විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය - (සභාපති)

* ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමා
  වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය

* ගරු වසන්ත සමරසිංහ මැතිතුමා
  වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය

* ගරු (ඉංජිනේරු) කුමාර ජයකොඩි මැතිතුමා
  බලශක්ති අමාත්‍ය

**********